www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ධර්මය II<br>கிறிஸ்தவம் II<br>Christianity II | 43 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස් :**

✳ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) ජුදා ජනතාවගේ සිනගෝගයේ වැදගත්කම පිළිබඳ කරුණු **හතරක්** ලියන්න.
(ii) ශුද්ධ වූ පාවුලුතුමාගේ පෞද්ගලික ජීවිතය පිළිබඳ කරුණු **හතරක්** සඳහන් කරන්න.
(iii) මුල් කිතුනු සභාවේ තේවාචාර්යවරුන් (දියාකෝනිවරුන්) සිදු කළ කාර්ය **හතර** සඳහන් කරන්න.
(iv) ක්‍රි.ව. 325-451 අතර පවත්වන ලද ක්‍රිස්තුවේදී ජගත් මන්ත්‍රණ සභා **හතර** නම් කරන්න.
(v) මුල් කිතුනු ජනවන්දනාවට ජුදා මූලාශ්‍රවලින් ලැබුණු ආභාස **හතරක්** සඳහන් කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

2. (i) මධ්‍යකාලීන යුගයේ චිත්‍ර ශිල්පයේ උන්නතියට දායක වූ පුද්ගලයින් **හතරදෙනකු** නම් කරන්න.
(ii) දිවැසිවරයා යනු කවුරුන් දැ'යි තහවුරු කිරීම සඳහා ලියැවී ඇති නිර්වචන **හතරක්** ලියන්න.
(iii) තෝමස්තුමාට දර්ශනය වීම මඟින් ජොහන්තුමා ශ්‍රාවකයන්ට දෙන ලද ආදර්ශ **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(iv) 1682 ජුලි 1 දරණ ආඥා පනතේ කතෝලිකයින්ට විරුද්ධව පැන වූ නීති නියෝග **හතරක්** දක්වන්න.
(v) බ්‍රිතාන්‍ය යුගයේ බිහි වූ මධ්‍ය පාසල් කොමිසම මඟින් අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු වූ සේවා **හතරක්** පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

3. (i) සීනයි ගිවිසුම ස්ථිර කිරීමේ පළමු අදියර (නික්මයාම 24 : 3 - 4) කරුණු **හතරකින්** දක්වන්න.
(ii) බ්‍රිතාන්‍ය යුගයේ ලංකාවට පැමිණි නිර්මල මරිය නිකායෙන් සිදු වූ සුවිශේෂී සේවා **හතරක්** ලියන්න.
(iii) දෙවන සියවස ආරම්භයේ දී ප්‍රසාද ස්නාපන සක්‍රමේන්තුව දානය කිරීමේ දී සිදු කළ ක්‍රියා **හතරක්** නම් කරන්න.
(iv) ගරු ටෙයියාර්ඩ් ඩෙ ෂාර්ඩෑන් පියතුමා (1881 - 1955) පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
(v) 1 කොරෙන්ති 12 : 21ට අනුව ඇස, අත, හිස සහ පාදය යන සංකේතවලින් පිළිබිඹු කෙරෙන කරුණු මොනවා ද?

(ලකුණු 04 × 5 = 20 යි)

## II කොටස

4. (i) විප්‍රවාසයෙන් අත්දුටු විශ්වාසයේ අභියෝගවලට මුහුණදීමේ දී වාචික සම්ප්‍රදායන් තුළ පැවති අදහස් ලේඛනගත කිරීමට අවශ්‍ය වූයේ මන්දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)
(ii) දෙවියන් වහන්සේගේ අභිමතය හා සැලැස්ම ඉටු වූ ආකාරය පෙන්වා දීමට රචනා කරන ලද ශුද්ධ බයිබලය ඇසුරෙන් ඔබේ දිවියෙන් දේව අභිමතය ඉටු වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 10 යි)

5. (i) දේවානුභාවය ක්‍රියාත්මක වන ආකාර **තුන** නම් කර, ඒවා එකින් එක උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10 යි)

(ii) දේවානුභාවයෙන් ලියැවුණු දේව වචනය මඟින් ද, විශේෂයෙන් නික්මයාම සිද්ධිය තුළින් ද දේව අනාවරණය ලබන ඔබ වත්මන් සමාජය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දකින්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

6. (i) මාටින් ලූතර් විසින් ආරම්භ කළ අවුස්බර්ග් ඇදහිල්ලේ සභාවේ ඉගැන්වීම් **දහයක්** පෙළගස්වන්න. (ලකුණු 10 යි)
(ii) ක්‍රිස්තියානි කලාවේ පහත සඳහන් අංශ පිළිබඳ ප්‍රධාන කරුණු **දෙක** බැගින් විස්තර කරන්න.
(අ) කිතුනු ලේඛනය
(ආ) කිතුනු සංගීතය
(ඉ) ගෘහ නිර්මාණ ශිල්පය
(ඊ) කැටයම් ශිල්පය
(උ) චිත්‍ර ශිල්පය

(ලකුණු 10 යි)

[ දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**7.** (i) පෘතුගීසි පාලනයෙන් මෙරටට අත් වූ යහපත් ප්‍රතිඵල පිළිබඳ ව ඇගැයීමක් කරන්න. (ලකුණු 10 යි)

(ii) "ශුද්ධ වූ ජුසේවාස් පියතුමා හා ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ලක්දිවට පැමිණීම හේතුකොටගෙන ලක් කිතුනු සසුනට නව යුගයක් උදා විය." යන්න පිළිබඳ ව පහත සඳහන් ශීර්ෂ යටතේ විස්තර කරන්න.

(අ) ශුද්ධ වූ ජුසේවාස් පියතුමා සිදු කළ දුෂ්කර සේවය

(ආ) ශුද්ධ වූ ජුසේවාස් පියතුමාගේ දයා සේවය

(ඉ) ශුද්ධ වූ ජුසේවාස් පියතුමාගේ දේශීය සංස්කෘතික අංග ලක්දිව කතෝලික දහමට සම්බන්ධ කළ ආකාරය

(ඊ) ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා සිංහල සාහිත්‍යයට සිදු කළ සේවය

(උ) ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගේ සංගීත කුසලතාව

(ලකුණු 10 යි)

**8.** (i) ලන්දේසි යුගයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ගොඩනැගුණු ආකාරය කරුණු **පහක්** ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 10 යි)

(ii) ශ්‍රී ලංකා දේශය තුළ මානව ගරුත්වය අභියෝගයට ලක් වූ අවස්ථාවල දී ලාංකීය කිතුනු සභාව ඒවා මැඩපැවැත්වීමට ඉදිරිපත් වූ අවස්ථා **පහක්** කෙරෙහි අවධානය යොමු කරමින් විස්තරයක් කරන්න. (ලකුණු 10 යි)

***

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .